සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்

## இரண்டாம் தவணைப் பரீட்சை - 2018

## දෙවන වාර පරීක්ෂණය - 2018

தரம் / ශ්‍රේණිය }10

**இரண்டாம் மொழி சிங்களம் - 1**

**දෙවන බස සිංහල - 1**

நேரம்: 3 மணித்தியாலம்

பெயர் / නම:

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1),(2),(3),(4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා ගන්න

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න

கவனிக்க

(i) எல்லா வினாக்களுக்கும் விடை எழுதுக.

(ii) 1 தொடக்கம் 40 வரையுள்ள வினாக்கள் ஒவ்வொன்றிலும் (1), (2), (3), (4) என எண்ணிடப்பட்ட விடைகளில் சரியான அல்லது மிகப் பொருத்தமான விடையைத் தெரிவு செய்க.

(iii) உமக்கு வழங்கப்பட்டுள்ள விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் உரிய வட்டங்களில் உமது விடையின் எண்ணை ஒத்த வட்டத்தினுள்ளே புள்ளடியை (X) இடுக.

---

♦ **අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට තද කළු අකුරින් මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පදය තෝරන්න**
**இல 1 முதல் 5 வரையுள்ள வினாக்களில் தடித்த எழுத்தில் தரப்பட்டுள்ள சொல்லுக்கு மிகப் பொருத்தமான சொல்லைத் தெரிவு செய்க.**

1. ඒ ප්‍රශ්නයට උත්තරය මම **දන්නෑ**
   1) දන්නවානෑ 2) දන්නෙනෑ 3) දන් එනෑ 4) දන්නේඑනෑ

2. උත්සවයට ඔය ගවුම **අඳින්නෙපා**
   1) අඳින් එපා 2) අඳින්න එපා 3) අඳින්නේ එපා 4) අඳින එපා

3. **මල්ලිත්තෙක්ක** මම ගෙදර යනවා
   1) මල්ලි එක්ක 2) මල්ලිත් එක්ක 3)මල්ලි එක 4) මල්ලිත් එක

4. අපි **වෑන්නෙකෙන්** පන්සලට යනවා
   1) වෑන් එකක 2) වෑන් එකේ 3) වෑන් එකෙන් 4) වෑන් එක

5. කළයට වතුර **පුරවන්නෝන**
   1) පුරවන නෝන 2) පුරවන්න ඕන 3) පුරවන් ඕන 4) පුරවන්නෙ නෑ

♦ **අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරෙන් නිවැරදි උච්චාරණය සහිත පදය තෝරන්න**
**இல 6 முதல் 10 வரையுள்ள வினாக்களில் சரியான உச்சரிப்பை தரும் சொல்லைத் தெரிவு செய்க.**

6. 1) පෙකෙට් එක 2) පැකෙට් එක 3) පැකට් එක 4) පෙකට් එක
7. 1) නැවත 2) නෙවෙන 3) නැවැත 4) නෙවැත
8. 1) වෙදිලා 2) වැදිලි 3) වෙතිලා 4) වැතිලා
9. 1) පරථමාධාර 2) පර්ථමාධාර 3) පරථමධාර 4) ප්‍රථමාධාර
10. 1) මොකගේද 2) මොගක්ද 3) මොගගේද 4) මොකක්ද?

- **අංක 11 සිට 14 තෙක් එක් එක් ප්‍රකාශය සඳහා වඩාත් ගැළපෙන ප්‍රශ්නය තෝරන්න**

  **இல 11 தொடக்கம் 14 வரையான ஒவ்வொரு கூற்றுக்கும் மிகப்பொருத்தமான வினாவினைத் தெரிவு செய்க.**

11 අන්න විදුහල්පතිතුමා මෙහාට එනවා

1) විදුහල්පතිතුමා එන්නේ ඇයි? 2) විදුහල්පතිතුමා එන්නේ මොකටද ?
3) විදුහල්පතිතුමා එන්නේ කීයටද? 4) විදුහල්පතිතුමා එන්නේ කොහාටද?

12. මම අලුත් පාසලකට යනවා

1) ඔයා යන්නේ කීයටද? 2) ඔයා යන්නේ මොකෙන්ද?
3) ඔයා යන්නේ කොහාටද? 4) ඔයා යන්නේ කවදාද?

13. පුස්තකාලයට එන්න කියලා අපිට නිවේදනයක් දුන්නා

1) ඔයාලාට එන්න කීවේ කවුද? 2) ඔයාලාට එන්න කිවේ කොහාටද?
3) ඔයාලාට එන්න කීවේ කවදාද? 4) ඔයාලාට එන්න කිවේ මොකෙන්ද

14. නිවාස කූඩාරම හදන්නේ අපි

1) ඔයාලා හදන්නේ කොහේද? 2) ඔයාලා හදන්නේ මොකක් ද?
3) ඔයාලා හදන්නේ මොකෙන් ද? 4) ඔයාලා හදන්නේ කවදා ද?

- **අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල නිවැරදි ව අකුරු යෙදී පදය තෝරන්න**

  **இல 15 தொடக்கம் 17 வரையுள்ள வினாக்களில் சரியான எழுத்துக்களைக் கொண்ட சொல்லைத் தெரிவு செய்க.**

15. 1)භාෂා අන්ශය 2) බාෂා අංශය 3) භාෂා අංශය 4) භාශා අංශය
16. 1) ශ්වාභාවික 2) ස්වාභාවික 3) ස්වාබාවික 4) ශ්වාබාවික
17. 1) ශ්‍රමදානය 2) සුමදානය 3) ශ්‍රමධානය 4) සුමධානය

- **අංක 18 සිට 20 තෙක් දී ප්‍රශ්නවල නොගැළපෙන පදය තෝරන්න.**

  **18-20 வரையுள்ள வினாக்களிகுப் பொருத்தமற்ற சொல்லைத் தெரிவு செய்க.**

18. 1) සතුට 2) දුක 3) ශෝකය 4) හැඬීම
19. 1) පුටුව 2) මේසය 3) බංකුව 4) බැංකුව
20. 1) ඉද්ද 2) රෝස 3) මානෙල් 4) පිච්ච

- **අංක 21 සිට 23 දක්වා ඇති ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට සමානාර්ථයක් දෙන පදය තෝරන්න**

  **21-23 வரையுள்ள வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு ஒத்தகருத்தைத் தரும் சொல்லைத் தெரிவு செய்க**


21. සගයා 1) ළමයා 2) පස මිතුරා 3) මිත්‍රයා 4) හතුරා
22. කුස 1) බිම 2) කසළ 3) අහස 4) බඩ
23. ලිඛිත 1) ලියන 2) අදින්න 3) හිතවත් 4) අලස

- **අංක 24 සිට 25 දක්වා ඇති ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය තෝරන්න**

  **24-25 வரையுள்ள வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு எதிர்க்கருத்தைத் தரும் சொல்லைத் தெரிவு செய்க**

24. විහිදුවා 1) එළිය 2) කරුවල 3) හකුළුවා 4) සූර්යයා
25. අස්සේ 1) එළියේ 2) කඩයේ 3) පහළ 4) ඇතුලේ


♦ **අංක 26 සිට 28 තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.**
**இல 26 தொடக்கம் 28 வரையுள்ள ஒவ்வொரு வினாவிலும் தரப்பட்ட படங்களுக்கான மிகப் பொருத்தமான கூற்றைத் தெரிவு செய்க.**



26. 1) පාපැදි ධාවන තීරුව ඉදිරියෙන්
    2) පාපැදි නවත්වන ස්ථානය ඉදිරියෙන්
    3) පාපැදි නැවතීම තහනම්
    4) පාපැදි මාරුවන ස්ථානය ඉදිරියෙන්



27. 1) ඇවිදීම තහනම්
    2) ඇතුල්වීම තහනම්
    3) පිරිමින්ට ඇතුල්වීම තහනම්
    4) තනියම ඇතුල්වීම තහනම්



28. 1) ඉදිරියෙන් වටරවුමක්
    2) ළමා උයන
    3) බඹරචක්‍රයක්
    4) ප්‍රතිචක්‍රකරණය

♦ **අංක 29 සිට 30 ප්‍රශ්නවලට ගැළපෙන උත්තරය තෝරන්න.**
**இல 29 முதல் 30 வரையுள்ள வினாக்களுக்கு பொருத்தமான விடையைத் தெரிவுசெய்க.**

29. පහත සඳහන් පදවලින් බහු වචන නාමපදයක් නොවන්නේ
    1) කම්කරුවෝ  2) පොත්  3) අත  4) කවර

30. කුරුල්ලෝ දෙපා සතුන් නම් කකුල් ගොඩක් ඇති සතුන්
    1) සිවුපා  2) අපා  3) බහුපා  4) එපා

♦ **අංක 31 සිට 32 යන එක් එක් ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක සම්බන්ධ කර එක් වාක්‍යයක් ලෙස නිවැරදිව ලියා ඇති වාක්‍යය තෝරන්න.**
**இல 31 முதல் 32 வரையுள்ள வினாக்களில் இரு வாக்கியங்கள் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும் இணைத்து ஒரு வாக்கியமாக்கி சரியாக எழுதப்பட்ட வாக்கியத்தைத் தெரிவு செய்க.**

31. ඈතින් වළහෙක් එනවා දැක්කේය. රාජා උස ගසකට නැග්ගේය
    1) ඈතින් වළහෙක් එන නිසා රාජා උස ගසකට නැග්ගා
    2) ඈතින් වළහෙක් එනවාට රාජා උස ගසකට නැග්ගේය
    3) ඈතින් වළහෙක් එනවා දැක රාජා උස ගසකට නැග්ගේය
    4) ඈතින් වළහෙක් එනවාට රාජා උස ගසකට නැග්ගා

32. අපි අලි නිවහනට ළඟා වුණෙමු. අපි කවුන්ටරය ළඟට ගියෙමු
    1) අපි අලි නිවහනට ළඟා වීමෙන් පසු කවුන්ටරය ළඟට ගියෙමු
    2) අපි අලි නිවහනට ළඟා වෙන්න කවුන්ටරය ළඟට ගියෙමු
    3) අපි නිවහන බලන්න කවුන්ටරය ළඟට ගියෙමු
    4) අපි අලි නිවහනේ කවුන්ටරය බලන්න ගියෙමු

♦ **අංක 33 සිට 34 ප්‍රශ්නවලට හිස්තැනට වඩාත් සුදුසු ගැළපෙන පදයතෝරන්න.**
**இல 33 முதல் 34 வரையுள்ள வினாக்களில் கீறிட்ட இடங்களுக்க மிகவும் பொருத்தமான சொல்லைத் தெரிவு செய்க.**

33. වළහෙක් .................................. දැක්කා
1) ඉන්න 2) ඉන්නවා 3) ඉදියි 4) ඉන්නේ

34. අපිට ඒබව............... කවදාද?
1) කියනවා 2) කව්වා 3) කියන්නේ 4) කියලා

♦ **අංක 35 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.**
**இல 35 ஆவது வினாவிற்கு விடையளிக்குக.**

35 මගේ ආච්චිගේ උපත සිදුවී ඇත්තේ 1943 දීය
ඉහත සඳහන් තද කළු අකුරෙන් මුද්‍රිත සංඛ්‍යාව නිවැරදිව ලියා ඇති පිළිතුර තෝරන්න
1) දහනවයයි හතළිස් තුන
2) එකයි නවසිය හතළිස් තුන
3) එකසිය අනූ හතරයි තුන
4) එක්දහස් නවසිය හතළිස් තුන

♦ **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න**
**இல 36 முதல் 40 வரையுள்ள வினாக்களில் இலக்கண ரீதியாக சரியாக சரியான வாக்கியத்தைத் தெரிக செய்க.**

36. 1) අම්මා ලේ කිරිකර අපට පොවති
2) අම්මා ලේ කිරිකර අපට පෙව්වේය
3) අම්මා ලේ කිරිකර අපට පෙව්වාය
4) අම්මා ලේ කිරිකර අපට පොවන්නේය

37. 1) ගුරු උපහාර උළෙලට ගුරුවරු පැඹිණෙයි
2) ගුරු උපහාර උළෙලට ගුරුවරු පැමිණෙමි
3) ගුරු උපහාර උළෙලට ගුරුවරු පැමිණෙති
4) ගුරු උපහාර උළෙලට ගුරුවරු පැමිණෙමු

38. 1) කමල් ගම්පොළ පාසලක ඉගෙන ගනිමි
2) කමල් ගම්පොළ පාසලක ඉගෙන ගනිති
3) කමල් ගම්පොළ පාසලක ඉගෙන ගනිමු
4) කමල් කම්පොළ පාසලක ඉගෙන ගනියි

39. 1) ගස් වැල් සුළගට ලෙවෙති
2) ගස් වැල් සුළඟට සෙලවෙයි
3) ගස් වැල් සුළඟට සෙලවුණෝය
4) ගස් වැල් සුළඟට සෙලවුණහ

40. 1) ඔහු වැඩ කරති 2) ඔහු වැඩ කරහු
3) ඔහු වැඩ කරයි 4) ඔහු වැඩ කරමි

(ලකුණු 2x20=40)

# **දෙවන බස සිංහල - இரண்டாம் மொழி சிங்களம் - II**

ශ්‍රේණිය / தரம் : 10

- පළමු කොටසේ අංක 1 හා 2 ප්‍රශ්න ඇතුළුව II කොටසින් එක් ප්‍රශ්නයක් ද III කොටසින් ප්‍රශ්න දෙකක් බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- **பகுதி I இல் முதலாம், இரண்டாம் வினாவையும், பகுதி II இல் ஏதேனும் ஒரு வினாவையும் பகுதி III இல் ஏதேனும் இரு வினாவையும் தெரிவு செய்து எல்லாமாக ஐந்து வினாக்களுக்கு விடை தருக.**

பகுதி I

**(1).** දී ඇති මාර්ගෝපදේශ අශ්‍රය කර ගනිමින් පහත සඳහන් මාතෘකා අතුරින් එකක් ගැන වචන 100ක පමණ රචනයක් ලියන්න.

**பின்வரும் தலைப்புக்களுள் ஒன்றைத் தெரிவு செய்து ஏறத்தாழ 100 சொற்களில் அமையுமாறு ஒரு கட்டுரை எழுதுக.**

අ) රුක්රෝපණය කිරීමේ අගය
1) හැඳින්වීම
2) රුක්රෝපණය කිරීමට හේතුව
3) රුක්රෝපණය කළහැකි අවස්ථා
4) රුක්රෝපණයෙන් ලැබෙන වාසි
5) සමාලෝචනය

ආ) විදුලිය පිරිමසමු
1) හැඳින්වීම
2) විදුලිය ලබා ගන්නා ක්‍රම
3) විදුලිය ලැබීමෙන් වෙන වාසි
4) විදුලිය නොමැති වීමෙන් ඇතිවෙන අයහපත් හානි
5) සමාලෝචනය

ඉ) මාගිය රජරට චාරිකාව
1) හැඳින්වීම
2) චාරිකාව සංවිධානය කළ ආකාරය
3) චාරිකාවේ දී නැරඹූ ස්ථාන
4) නැරඹීමෙන් ලැබුණු අත්දැකීම්
5) සමාලෝචනය


ඊ) පාසල් පුටුවක් කතා කරයි
1) මෙය මනඃකල්පිත මාතෘකාවක් ලෙස සැලකීම
2) පුටුව සකස් කළ අය හා සකස් කළ අමුද්‍රව්‍ය
3) ළමයින්ට පුටුවෙන් වූ සේවය
4) අවසානයේ දී පුටුවට වූ දේ
5) සමාලෝචනය

උ) මගේ පුංචි මල්වත්ත
1) හැඳින්වීම
2) මල්වත්තේ පිහිටීම
3) මල්වත්තේ ඇති මල් වර්ග
4) එයින් ඇති ප්‍රයෝජන
5) සමාලෝචනය

*(20 புள்ளி)*

**02.** පහත සඳහන් පින්තූරය පදනම් කරගනිමින් අර්ථවත් වාක්‍ය පහක් ලියන්න. එක් එක් වාක්‍යයකට වචන හතරකට නොඅඩුව තිබිය යුතුයි.

**பின்வரும் படத்தை அடிப்படையாகக் கொண்டு ஐந்து கருத்துள்ள வாக்கியங்கள் எழுதுக. ஒரு வாக்கியத்தில் நான்கு சொற்களுக்கு குறையாமல் இருத்தல் வேண்டும்.**



(10 புள்ளிகள்)

II **- කොටස**

♦ 3, 4 යන ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.
**3, 4 வினாக்களுள் ஏதேனும் ஒன்றிற்கு விடை எழுதுக.**

**03.** පහත කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
**பின்வரும் பாடலை வாசித்து அதன் கீழ் தரப்பட்டுள்ள வினாக்களுக்கு பூரணமான வாக்கியங்களில் விடை எழுதுக.**

1. කුරුල්ලනේ ගී ගයන්න
අහස පුරා සැරි සරන්න
ඔබත් එක්ක පියාඹන්න
පියාපතක් මටත් දෙන්න

2. සමනලයිනි හනික එන්න
මල් පැණිවල රස බලන්න
ඔබගේ එක්ක මලට යන්න
පියාපතක් මටත් දෙන්න

3. වදයේ පැණි පුරවගන්න
මී මැස්සනි පැණී සොයන්න
ඔබත් එක්ක එකතු වෙන්න
පියාපතක් මටත් දෙන්න

4. අන්සතු ලේ උරා බොන්න
දරුණු රෝග පතුරුවන්න
මදුරුවන්ට ඉගිළ යන්න
පියාපතක් එපා දෙන්න

5. ජීවය අවසන් කරන්න
මෙරුවන් හට ඉඩ ලැබෙන්න
පහන ළඟට පියාඹන්න
පියාපතක් එපා දෙන්න

1) සමනලයාගෙන් පියාපතක් ඉල්ලන්නේ ඇයි?
2) මී මැස්සන්ගෙන් ඉටුවන සේවය කුමක්ද?
3) පියාපත් දෙන්න එපා කියන්නේ කාට කාටද?
4) මදුරුවාගෙන් සිදුවන අහිතකර දෙයක් ලියන්න
5) පහත සඳහන් පද වලට සමාන පද කවි පංතියෙන් තෝරා ලියන්න
1. ගුවන 2. තටුව

(10 புள்ளி)

**04.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට සම්පූර්ණ පිළිතුරු ලියන්න
**பின்வரும் உரைப்பகுதியை வாசித்து அதன் கீழ் தரப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.**

පාසලේ අප්‍රේල් නිවාඩුව ගිය සතියේ ලැබුණි. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද එනතුරු අපි පලා සිටියෙ මු. මෙවර අලුත් අවුරුද්ද වෙනදාට වඩා ප්‍රීතිමත් ය. විදෙස්ගතව සිටින අපේ නැන්දත් මාමත් පැමිණෙන බව දන්වා තිබුණි. ඔවුන් සමග නංගීත් මල්ලීත් පැමිණෙන නිසා අපි ඉතාමත් සතුටින් සිටියෙමු. ඔවුන් අපට තෑගි බෝග ගෙන එන බව දන්වා තිබුණි. අලුත් අවුරුද්ද වෙනදාට වඩා හොඳින් කිරීමට අම්මත් තාත්තත් සිතෙන බව පෙනුණි. තාත්තා ගේ සෝදා පිරිසිදු කර අලුතෙන් තීන්ත ගැවේ ය. අම්මා ජනෙල් දොරවල් සඳහා අලුත් තිරරෙදි දැම්මා යා. මේ නිසා නිවසට සුන්දර පෙනුමක් ලැබී ඇත.

1) අප්‍රේල් නිවාඩුව ලැබෙන්නේ කුමක් වෙනුවෙන් ද?
2) මෙවර අලුත් අවුරුද්ද ප්‍රීතිමත් වීමට හේතුව කුමක් ද?
3) අලුත් අවුරුද්ද වෙනදාට වඩා හොඳින් කිරීමට සිතන්නේ කවුරුන්ද?
4) අවුරුද්ද වෙනුවෙන් තාත්තා කළ කාර්යයන් දෙකක් ලියන්න?
5) ජනෙල් දොරවල් වලට අලුත් තිරරෙදි දැම්මේ කවුද?

(10 புள்ளிகள்)

## III **කොටස**

♦ 5,6 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
**5,6 ஆகிய வினாக்களுக்கு விடை எழுதுக.**

ඔබ කෑගල්ල අවිස්සාවේල්ල පාරේ පදිංචි සඳුන් ප්‍රියදර්ශන යයි, සිතා ඔබේ ගමට නායයාමේ අනතුරු ඇතිවිය හැකි බව දන්වා ඒ පිළිබඳ සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ඉල්ලමින් කෑගල්ල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් තුමාට යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

නැතහොත්

මහව දළදාගම මහ විදුහලේ පැවැත්වීමට නියමිත චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීම සඳහා මහව කලාප අධ්‍යාපන කාර්යලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තුමියට යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න

ඔබ විද්‍යාලීය සාහිත්‍ය සංගමයේ ලේකම්, පරාක්‍රම ප්‍රනාන්දු යැයි තිගන්න, ඔබ කැමති දිනයක් හා වේලාවක් යොදා ගන්න.

(10 புள்ளிகள்)

6. පහත සඳහන් දෙමළ ඉංග්‍රීසිවාක්‍ය සිංහල භාෂාවට පරිවර්තනය කරන්න.
பின்வரும் தமிழ் வாக்கியங்களைத் சிங்கள மொழி பெயர்க்க.
1) என்னால் நன்றாகப் பாடமுடியாது?
2) எனக்கு பதிமூன்று வயதாகிறது?
3) எனது தாய் ஓர் சிறந்த ஆசிரியை ஆவாள்.
4) நாம் எல்லோரும் ஒன்றுபட்டு எமது நாட்டை கட்டியெழுப்புவோம்

5) எனது பாடசாலை பெரிய பாடசாலை ஆகும்.

1) I can't sing well
2) I am thirteen Years Old
3) My mother is a good teacher
4) Let's all be united and build our country
5) My school is a big school

නැතහොත්

සමන්කුමාර නැමති ශිෂ්‍යයා සිංහල දෙවනභාෂාව තරඟයෙන් පළාත් මට්ටමෙන් ප්‍රථම ස්ථානය ලබා ඇති බවත් ජාතික මට්ටමේ තරඟය කොළඹ ඉක්බාල් මු.ම.වි. පැවැත්වෙන බවත්, 2018.07.22 වන දින පෙ.ව. 9.00ට ඒ වෙනුවෙන් ශිෂ්‍යයාව සහභාගි කරවන ලෙසත් දන්වා එවා ඇත.

සමන්කුමාර හා විෂයභාර ගුරුතුමිය අතර ඇතිවන සංවාදය සකස් කරන්න / ලියන්න

சமன்குமார எனும் மாணவனுக்கும் பாடப்பொறுப்பு ஆசிரியையிற்கும் இடையிலான உரையாடலை எழுதுக.

1) අමාන්ත්‍රණය
2) කාරණාව පිළබඳ විමසීම
3) පවත්වන දිනය ස්ථානය හා වෙලාව පිළිබඳ විමසීම
4) සහභාගි වෙන ආකාරය පිළිබඳ විමසීම
5) ස්තුති කිරීම

(10 புள்ளிகள்)